# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

39 වන කාණ්ඩය | 02 වන කලාපය | 2022 නොවැම්බර් කලාපය


# කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ ජාත්‍යන්තර දින සැමරුම 2022




සෑම වසරකම නොවැම්බර් මස 25 එනම් ජාත්‍යන්තර මානව හිමිකම් දිනය දක්වා කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය ලෙස හැඳින්වේ.

කාන්තාවන්ට එරෙහි සියලු ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීමේ ජාත්‍යන්තර දිනය ධාබිඳු සාමූහිකය විසින් 2022 දෙසැම්බර් 04 වන දින වව්නියාවේදී සමරන ලදි. මෙම අවස්ථාවට ප්‍රදේශය නියෝජනය කරමින් සිවිල් සංවිධාන රාජ්‍ය නිළධාරින් සහ ධාබිඳු සාමාජිකයින් සම්බන්ධ විය.

වව්නියා නගර මධ්‍යයේ ඉතාමත් සාර්ථකව පැවති

2 වන පිටුවට...

ඇතුළු පිටු


**03 පිටුව** - කාන්තා ප්‍රචන්ඩත්වයට එරෙහි

**04 පිටුව** - සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති කණ්ඩායම සමඟ රැස්වීමක්

**05 පිටුව** - අතුරුදහන් වී වසර 33ක්

**06 - 08 පිටුව** - අපේ වැඩ

**09 පිටුව** - විදෙස් පුවත්

**10 පිටුව** - සිතුවිල්ල / ප්‍රහේලිකාව

**11 පිටුව** - කවි පිටුව


**නිදහස් වෙළඳ කලාපයේ ඉපැරණිම පුවත්පත**

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# බහුවිධ අර්බුධයන්ට කොකා පෙන්වූ අයවැය

සමාජ, ආර්ථික, දේශපාලනික කඩාවැටීම් හමුවේ මෙවර ඉදිරිපත් කළ ජනපීඩක අයවැය, තීන්දු ගන්නා සුළු පිරිසකගේ බලය තවදුරටත් තහවුරු කර ගැනීමටත් වැඩිපිරිසක් දුප්පත්කමේ ආගාධයට දැමීමත් සිදු කරන ලදි. මෙය වඩාත් හොඳින් පැහැදිලි වන්නේ අත්‍යාවශ්‍ය සේවාවන් වන සෞඛ්‍ය අංශයට ඩොලර් බිලියන 322ක් සහ අධ්‍යාපනයට ඩොලර් බිලියන 232ක් වෙන් කරමින් හා යුධ විරාමයෙන් දශකයකට  අධික කාලයක් ගත වී ඇතත්  ආරක්ෂක අංශයට ඩොලර් බිලියන 539ක් මෙහිදී වෙන් කරන ලදි. ආරක්ෂක අංශයට වෙන් කර ඇති මෙම මුදලින් මහජන ආරක්ෂාව සඳහා ශත වලින් මුදල් වැය කරන අතර ප්‍රභූ ආරක්ෂාව වෙනුවෙන් කෝටි ගණනින් වියදම් කරනු ලැබේ.

වසර 74ක් තිස්සේ දුප්පත්කම නැතිකරනවා කියමින් බලයට පැමිණි හැම රජයක්ම දුප්පත්කම රඳවා තබා ගනිමින්  බලය තහවුරු කරගැනීමට ගත් උත්සහය නිසා රටේ අති බහුතරයක් වූ දුප්පත්තුන්ට සෞඛ්‍යයට, අධ්‍යාපනයට, ප්‍රවාහනයට ඇති අවස්ථාව අහිමි කොට ඇත.

පාලකයන්ගේ පටු අරමුණු ඉටුකර ගැනීමට ඔවුන් ගන්නාවූ අසාධාරණ තීන්දු තීරණ නිසා අසරණ වූ දුප්පත් ජනතාව මෙම තත්වයෙන් මිදීම සඳහා මත්ද්‍රව්‍යය විකිණීමට, හොරකම් කිරීමට, වංචාවට පෙළඹී ඇත.

පදික වෙළෙන්දාගේ සිට සුපිරි වෙළෙන්දා දක්වා බදු අය කරමින් සිටින නිසා ප්‍රධාන ආහාරවේල් 3 න්  එකදු වේලක්වත් සපුරා ගැනීමට නොහැකිවන තත්වයට දිළින්දා පත්ව ඇත. නමුත් ආර්ථික අපරාධකරුවන් කිසිදු දඬුවමක් නොලබා රජසැප විඳිමින් සිටී.

මේ වන විට දිළින්දන් අධ්‍යාපනය හැරයෑමද, විද්වතුන් සහ හැකියාවෙන් පිරිපුන් තරුණ කැළ රට හැරයෑමද, නිෂ්පාදන ක්ෂේත්‍රයේ පිරිවැය, විදුලි කප්පාදුව, ඉන්ධන හිඟය නිසා ඇඟලුම් ක්ෂේත්‍රය කඩා වැටීමද රට දැඩි ආර්ථික අර්බුධයකට වැටීමට හේතු විය.

සෑම ක්ෂේත්‍රයක්ම ඵලදායී නවාකරණයට යොමු කරමින් විශේෂයෙන් රටේ ආර්ථිකයට වැඩි දායකත්වයක් දෙන කාන්තා ශ්‍රමය පිළිබඳ සාධාරණීය මැදිහත් වීමකට රජය උත්සහ ගෙන නොමැත.

මේ වන විට ඩොලර් බිලියන 100ට ආසන්න ණය බරක් දරන ශ්‍රී ලංකාවේ අයවැය හිඟය පියවා ගැනිමට සහ ගෙවුම් ශේෂය පියවා ගැනීමට අවශ්‍ය විකල්ප ආර්ථික වැඩපිළිවෙලක් හඳුන්වා දීමට කිසිදු පියවරක් මේ වනතෙක් ගෙන නැත. අවසානයේ ණය බර සහ බදු බර සෘජු හා වක්‍රාකාරයෙන් දිළින්දාටම දරන්නට සිදු වී ඇත. දශක ගණනක් මුළුල්ලේ සංවර්ධනය සඳහා ගත් ණය වලින් රටේ දියුණු වෙලා නැතිනම් ගත් ණය යොදවා කළ සංවර්ධනය කුමක්ද?

මූලික මිනිස් අයිතිවාසිකම් වන ආහාර, සෞඛ්‍ය, අධ්‍යාපනය වැනි ක්ෂේත්‍ර වලට නිසි පරිදි අයවැයෙන් මුදල් වෙන් කර නොමැති නිසා මිනිසුන්ගේ සතුට, විනෝදය අහිමි කරමින් ඔවුන්ව ඉච්ඡා භංගත්වයට පත්කොට ඇත.

1 පිටුවෙන්... **කාන්තාවන්ට එරෙහි**

සාමකාමී විරෝධතාවයෙන් පසුව ග්‍රීන්පාක් උත්සව ශාලාවේ දී සියයකට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් යුතුව මෙම වැඩසටහන පවත්වන ලදි.

අපගේ ආරාධනය පිළිගෙන ප්‍රධාන දේශනය සඳහා පැමිණි දේශපාලනයේ කාන්තා දායකත්වය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ඇති පුත්තලම දිස්ත්‍රික්කයේ හිටපු පලාත් සභා මන්ත්‍රීවරියක් වන බිසිලියා භූතෝ මහත්මිය විසින් ඇයගේ අදහස් දක්වන ලද අතර කාන්තාව යනු නිර්භීත කෙනෙක් බැවින් තමාගේ ගැටලු සඳහා තමාම නැගී සිටිය යුතු බවත් එයට සරිලන පරිදි නීතිරාමු සැකසිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

මෙහිදී කටුනායක, බියගම, වව්නියා සහ කිළිනොච්චි යන දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පැමිණි අපගේ සාමාජිකාවන් වැඩ ලෝකය තුළ සිදුවන හිංසනයන් හා ප්‍රචණ්ඩත්වයන් පිළිබඳ සිය අත්දැකීම් සභාවට ඉදිරිපත් කරන ලදි.

වව්නියා පොලිස් ස්ථානය නියෝජනය කරමින් ළමා හා කාන්තා කාර්යංශයේ ප්‍රධාන නිළධාරීතුමා ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තා කටයුතු නිළධාරිතුමිය සහ සිවිල් සංවිධාන නියෝජනය කරමින් පැමිණි පිරිස ද සභාව අමතමින් ප්‍රකාශ කර සිටියේ ඉදිරියේ දී සියලු දෙනා එකතු වී මෙම ගැටලු විසදා ගැනීමට කටයුතු කළ යුතු බවය.

එදින සභාව විචිත්‍රවත් කිරීම සඳහා අපගේ සාමාජිකාවන් නර්තන අංගයන් ඉදිරිපත් කරන ලදි.



# කාන්තා ප්‍රචන්ඩත්වයට එරෙහි දිනය

සෑම වසරකම නොවැම්බර් මස 25වන දින කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ ජාත්‍යන්තර දිනය ලොව පුරා සමරනු ලබයි. මෙම දිනය දින 16ක් පුරාවට විවිධ වැඩසටහන් පවත්වමින් සමරනු ලබන අතර සෑම වසරකම නොවැම්බර් මස 25 වන දින කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව දිනය තුළ මෙකී වැඩසටහන් ආරම්භක දිනය ලෙසත් දෙසැම්බර් 10 වන දින ජාත්‍යන්තර මානව හිමිකම් දිනය තුළ වැඩසටහන් අවසන් දිනය ලෙසත් සලකනු ලබයි. එහි මෙවර තේමාව වන්නේ එකතු වන්න! කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය අවසන් කිරීමේ ක්‍රියාකාරීත්වයට" යන්නයි.

කාන්තාවන්ට වෙනස් කොට සැලකීම සහ හිරිහැර කිරීම නිවසේ හෝ කාර්යාලයේ වේවා සෑම තැනකම දක්නට ලැබේ. එසේ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා පවුල තුළින්, ප්‍රජාව තුළින් හා රාජ්‍ය මඟින් ආදී ලෙස දැක්විය හැකිය.

- **පවුලෙන් තුළ හිංසාවන් ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ව්‍යභිචාරය (ලේ ඥාතීන් අතර සිදුවන්නාවූ ලිංගික සම්බන්ධතා), වෛවාහක ස්ත්‍රී දූෂණය සැලකිය හැක.**
- **ප්‍රජාව තුළින් සිදුවන හිංසාවන් ලෙස ලිංගික අතවර කිරීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අඩන්තේට්ටම් කිරීම, ගණිකා වෘත්තිය, ගබ්සා කිරීම ආදිය දැක්විය හැකිය.**
- **රාජ්‍ය තුලින් සිදුවන හිංසාවන් ලෙස ලිංගික අල්ලස් ලබා ගැනීම, සේවා ස්ථාන මාරු කිරීම, මානසික හිංසනය, විදේශගත ශ්‍රමිකයින්ට නිසි රැකවරණ ලබා නොදීම, ආදිය ප්‍රචණ්ඩත්වයන් හා හිංසන ලෙස නම් කළ හැකිය.**

මෙසේ විවිධාකාර මුහුවරක් ගන්නා ප්‍රචණ්ඩත්වයට නීතිමය රාමුව තුළ කුමන ආකාරයේ ප්‍රතිපාදන පවතිනවාද යන්න පිළිබඳව සොයා බැලීම වැදගත් වේ. 1995 අංක 22 දරණ දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත මඟින් කාන්තා හා ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ඇති ප්‍රතිපාදන දේශීය ව්‍යවස්ථාවට ඇතුළත් කොට ඇත. එහි 345 වගන්තිය මඟින් ලිංගික හිංසනයට එරෙහිව දණ්ඩනයෙන් ප්‍රතිපාදන දක්වා ඇත. එසේම 1994 අංක 22 දරන වධහිංසාවට එරෙහි වූ පනත මඟින් එක්සත් ජාතීන්ගේ වධහිංසාවට එරෙහි සම්මුතිය දේශීය නීතියට ඇතුළත් කර ඇත. තවද 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මඟින් මානව අයිතිවාසිකම් කිහිපයක් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගෙන ඇත. මෙම අයිතිවාසිකම් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු අයිතිවාසිකම් දෙකක් දක්නට ලැබේ. එනම් 12 ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති සමානාත්මතාවය සහ 11 වන ව්‍යවස්ථාව මඟින් පිළිගෙන ඇති කෲර අවමන් සහගත වධහිංසා සහ සැලකිල්ලට ලක් නොවී සිටීමේ අයිතිවාසිකමයි. තවද 12 (2) ව්‍යවස්ථාව මඟින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කිසිවකු වෙනස්කමකට ලක් නොකළ යුතු බව වැඩිදුරටත් සඳහන් වේ.

8 වන පිටුවට...



# සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති කණ්ඩායම සමඟ එක්සත් රාජධානියේ නියෝජිත රැස්වීමක්



වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඇඟළුම් කර්මාන්තයේ පවතින තත්වය පිළිබද සාකච්ඡා කිරීම සඳහා War on want සංවිධානයේ ආරාධනය මත එරට වෘත්තීය සමිති නායකයින් ඇතුළු පිරිසක් නොවැම්බර් මසදී ලංකාවට පැමිණෙන ලදි. රාජ්‍ය පාර්ශවයන් මෙන්ම වෘත්තීය සමිති ක්‍රියාකාරීන්වද මුණගැසුණු එම පිරිස නිදහස් වෙළඳ කලාපයේ කම්කරු පාර්ශවයන් නියෝජනය කරන ඩාබිඳු සාමූහිකය ඇතුළු කාන්තා නායකත්වය යටතේ ක්‍රියාකරන වෘත්තීය සමිති මුණ ගැසීමටද ඔවුන් අවස්ථාවක් සකසා ගන්නා ලදි. ක්ෂේත්‍රයේ පවතින ගැටළු සම්බන්ධව පැමිණ සිටි සංවිධාන විසින් පවසන ලද අතර ඉදිරියේදී ජාත්‍යන්තර සහයෝගය ඇතිව ක්‍රියාකරන්නේ කෙසේද යන්න පිළිබඳව මෙහිදී වැඩිදුරටත් සාකච්ඡා කරන ලදි. මෙහිදී විශේෂයෙන්ම වෘත්තීය සමිති මුහුණ දෙනු ලබන ගැටළු පිළිබඳවද සාකච්ඡා කළ අතර එක්සත් රාජධානියේ නියෝජිතයන් සමඟ අවිධිමත් සාකච්ඡාවක්ද පවත්වන ලදි.



# අතුරුදහන් වී වසර 33ක්

ලයනල් රංජිත් සොහොයුරන් අතුරුදහන් වී මෙම වසරට, වසර 33ක් සම්පූර්ණ වේ. ඔවුන්ගේ ගුණ සමරණු වස් 2022.10.27 වන දින අතුරුදහන් වූ පවුල් එකතුව විසින් රද්දොලුගම පිහිටා ඇති අතුරුදහන් වූ අයගේ ස්මාරකය අසල සමරණු ලැබීය.

කලාපයේ සේවක සේවිකාවන්ගේ ගැටළු වෙනුවෙන් පෙනී සිටී පුද්ගලයන් වශයෙන් ඔවුන්ව හඳුන්වා දිය හැකිය. වෙළඳ කලාපය තුල පිහිටි ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනයේ සේවය කල රංජිත් සොහොයුරා එම කර්මාන්ත ශාලාවෙහිදී කම්කරුවන් මුහුණ දෙන විවිධ කාර්මික අනතුරු මෙන්ම ඔවුනට හිමිවිය යුතුව තිබූ වරප්‍රසාද හිමි නොවීම නිසා පාලකයන් සමඟ ගැටුම් ඇති කරගන්නා ලදි. ආයතනය තුල සිදු වූ ප්‍රශ්න පිළිබඳවද ඔහු ඩාබිඳු පුවත්පතට වාර්තා කරන ලදි. මේ නිසා බොරු ආරවුලක පටලා ඔහුගේ වැඩ තහනම් කල අතර ගෘහස්ථ පරීක්ෂණයකට යොමු කරන ලදි. එම පරීක්ෂණය අවසන් වී එන විට ඔහු අතුරුදහන් විය.

කලාපය තුල සිදුවන අසාධාරණවලට එරෙහිව නීති උපදෙස් සහ නීති ආධාර කම්කරුවන්ට ලබා දෙන ලද්දේ ලයනල් සොහොයුරා විසිනි. රංජිත් සොහොයුරාහට අවශ්‍ය නීති ආධාර ලබා දෙන ලද්දේද ලයනල් සොහොයුරා විසිනි. මෙම කටයුතු සාර්ථක ලෙස අවසන් වූ අතර රංජිත් සොහොයුරාහට සාධාරණය ඉටු විය. රංජිත් සොහොයුරාගේ ගෘහස්ථ පරීක්ෂණය නිම වී එන විට ලයනල් සොහොයුරාද රංජිත් සොහොයුරා සමඟ අතුරුදහන් විය.

2022 10 27 වන දින පවත්වන ලද 33 වන ගුණානුස්මරණ සැමරුමේදී අදහස් දක්වමින් ජයන්ති දංදෙනිය මහත්මිය විසින් ප්‍රකාශ කලේ අතුරුදහන් වී දශක 3ක් ගත වුවද මෙතෙක් ඒ පිළිබදව කල පැමිණිලි සඳහා කිසිදු පිලිතුරක් ලැබී නොමැති බවයි. එසේම තවමත් ඔවුන් වෙනුවෙන් මරණ සහතිකයක් හෝ නොමැති බවය.

# සුව හා රැව

# ලෝක ඒඩ්ස් දිනය

සෑම වසරකම දෙසැම්බර් මස 1වනදා ලෝක ඒඩ්ස් දිනය 1988 සිට සමරනු ලබයි. ඇත්තටම මොකක්ද මේ ඒඩ්ස් කියන්නේ

ඒඩ්ස් යනු සරලවම නතුකරගත් ප්‍රතිශක්ති ඌනතාවයයි. එච්.අයි.වි (ප්‍රතිෂක්ති ඌනතා වෛරසය) පාලනය කිරීමට නොහැකි වුවහොත් ඒඩ්ස් රෝගී තත්වය අප ශරීරයේ ඇති වේ. එච්.අයි.වි රෝගී තත්වය ඇති සියලුදෙනාම ඒඩ්ස් රෝගයට ගොදුරු වන්නේ නැත. එච්.අයි.වි රෝගී තත්වය මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීමෙන් හා ප්‍රතිකාර ගැනීමෙන් පාලනයකර ගැනීමට හැකිය. නමුත් ප්‍රතිකාර නොගන්නා පුද්ගලයන්ට ඒඩ්ස් රෝගය ඇතිවිය හැකිය. එච්.අයි.වි රෝගට ගොදුරු වි වසර 10ක් පමණ ඇතුළත ඒඩ්ස් රෝගී තත්වය ඇතිවේ. ඒඩ්ස් රෝගය යනු මාරාන්තික රෝගී තත්වයකි. එම නිසා එච්.අයි.වි රෝගයෙහි මුල් අවස්ථාවේ දී ප්‍රතිකාර සඳහා යොමුවිය යුතුය.

### එච්.අයි.වි රෝගය බෝවන අවස්ථා

- අනාරක්ෂිත ලිංගික ක්‍රියාකාරකම්
- අසාදිත මවගෙන් දරුවන්ට
- අනාරක්ෂිත මෙවලම් භාවිතය
- ලේ බෙදා හැරීම සහ අවයව බද්දය

### එච්.අයි.වි රෝගය බෝ නොවන අවස්ථා

- මදුරු දෂ්ඨනය
- වැසිකිළි පාවිච්චිය
- සිප වැළඳ ගැනීම
- ආහාර අනුභව කරන උපකරණ
- ස්පර්ශය

### එච්.අයි.වි අවධානම අඩු කරගන්නේ කෙසේද

- එක් පුද්ගලයෙකු සමඟ පමණක් ලිංගිකව එක් වීම
- ලිංගිකව එක් වීමේ දී ආරක්ෂක ක්‍රම අනුගමනය කිරීම
- නිසි ප්‍රතිකාර සඳහා යොමුවීම

### එච්.අයි.වි රෝග පරීක්ෂාවන් සිදු කරගන්නේ කෙසේද

- ඔබගේ පෞද්ගලික වෛද්‍යවරයා හමුවීමෙන්
- ලංකාව පුරා පවතින ලිංගාශ්‍රිත සායන හරහා නොමිලේ සිදු කරගත හැකිය.

**මධුමාලි සිරිවර්ධන**

(තොරතුරු අන්තර්ජාලය ඇසුරිනි)



# ඇඟලුම් කම්කරු කාන්තාවන්ගේ මානසික සුවය සඳහා උපදේශන වැඩසටහනක්

වර්තමානය වන විට රටේ පුරවැසියන් මුහුණ පා ඇති සමාජ ආර්ථික ගැටළුකාරී තත්වයන් හමුවේ ඇඟළුම් කම්කරුවන්හට විදින්නට සිදුව ඇති විවිධාකාරයේ ගැටළු නිසා ඔවුන් මානසික පීඩාවන්ට පත් ව ඇත. මෙයට පිළියම් ලෙස ඩාබිඳු සාමූහිකය පසුගිය කාලයේ උපදේශණ වැඩසටහන් කිහිපයක් පැවැත් වූ අතර ඔක්තෝම්බර් මස 9 වන දින බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ දී අපගේ සාමාජික සාමාජිකාවන් සඳහා පෞද්ගලික උපදේශණ සේවාවක් පවත්වන ලදි. මෙහිදී සම්පත්දායිකාව ලෙස සම්බන්ධ වූයේ ළමා හා කාන්තා කාර්යාංශයේ සමාජ බල ගැන්වීමේ අංශයේ මනෝවිද්‍යා උපදේශිකා ප්‍රදීපා වික්‍රමසිංහ මහත්මියයි. ඒ සඳහා සම්බන්ධ වූ පිරිස ප්‍රකාශ කර සිටියේ හැම අතකින්ම පීඩාවට පත්ව සිටින අපට මෙම වැඩසටහන තුළින් තම මානසික සෞඛ්‍ය සඳහා ඉතා ප්‍රයෝජනවත් වූ බවයි.

# වෘත්තීය අයිතීන් තහවුරු කිරීමට කම්කරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන

උතුරු ප්‍රදේශයේ ඇඟළුම් කම්කරු කාන්තාවන් සවිබල ගැන්වීම සහ ඒකාබද්ධ කිරිමේ අරමුණ ඇතිව ඩාබිඳු සාමූහිකය විසින් "බලමුළු ගැන්වීමේ" වැඩසටහන් මාලාවේ පළමු වැඩසටහන ඔක්තෝම්බර් මස 29 සහ 30 යන දෙදින කිලිනොච්චියේ දී පවත්වන ලදි. මෙයට කිලිනොච්චි සහ වව්නියා දිස්ත්‍රික්ක නියෝජනය කරමින් ඩාබිඳු සාමූහිකය සමඟ ක්‍රියාකරණ දෙවන පෙළ නායිකාවන් පහලොස් දෙනෙකු සම්බන්ධ විය. එහිදී ඔවුන් මුහුණ දෙන ගැටළු, කම්කරු අයිතිවාසිකම් පිළිබඳව සාකච්ජා කළ අතර ඉදිරියේ දී වැඩපල මට්ටමේ වන කම්කරු නීති උල්ලංඝණය කිරීම් වලට සාමූහිකව මැදිහත් වන්නේ කෙසේද යන්න පිළිබඳව අවධානය යොමුවිය. මෙම වැඩසටහනේ සම්පත්දායිකාව ලෙස නුවර මානව සංවර්ධන ආයතනයේ කේ.යෝගේෂ්වරී මහත්මිය සම්බන්ධ විය.



# ද්විතීයික පුහුණු පාඨමාලාවේ දෙවන වැඩසටහන





උතුරු ප්‍රදේශයේ ඇඟළුම් කම්කරුවන් සඳහා වන නායකත්ව පුහුණු වැඩසටහන් මාලාවේ දෙවැනි පියවර නොවැම්බර් මස 12 සහ 13 යන දෙදින තුළ කිලිනොච්චි නගරය පදනම් කරගනිමින් පවත්වන ලද අතර ඔවුන් මුහුණ දෙන ස්ත්‍රී/ පුරුෂ සමාජභාවීය ගැටළු පිළිබඳව මෙහිදී වැඩි අවධානයක් යොමු කරන ලදි. මෙම වැඩසටහන සඳහා සම්පත්දායිකාව ලෙස කාර්තිහා තනංජනා මහත්මිය සම්බන්ධ විය.

# වෘත්තීය සමිති අත්දැකීම් බෙදාගැනීමේ වැඩසටහන




ඩාබිඳු සාමූහිකය විසින් වෘත්තීය සමිති සාමාජිකයින් සමග වෘත්තීය සමිති අත්දැකීම් බෙදාගැනීමේ වැඩසටහනක් ඔක්තෝබර් 19 වන දින කටුනායක ඩාබිඳු කාර්යාලයේදී පවත්වන ලදී. මෙහිදී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදි.

1. පවතින තත්වය හමුවේ වෘත්තීය සමිතීන්හි ක්‍රියාකාරිත්වය.
2. සාමාජිකත්වය වර්ධනය කිරීමේදී මුහුණපාන අභියෝග.
3. අනෙකුත් පාර්ශවකරුවන් සමග සබඳතා වර්ධනය කර ගැනීමේ ආකාරය.
4. වැටුප් ව්‍යාපාරය සහ කම්කරු නීති සම්පාදනය සඳහා සහයෝගීතාවයෙන් ජාලගත කර ක්‍රියාකරන ආකාරය.
5. කාන්තා වෘත්තීය සමිති ජාල අභියෝග.



# පොදු කුස්සිය










ඩාබිඳු සාමූහිකය විසින් කම්කරුවන් මුහුණ පා සිටින ආර්ථික අර්බුදයට යම්කිසි සහනයක් සැලසීම අරමුණු කොටගෙන පවත්වනු ලබන පොදු කුස්සිය වැඩසටහන් මාලාව ඔක්තෝම්බර් මස 2වන දින කිලිනොච්චිය පදනම් කරනිමින් හා 16 වන දින හා 23වන දින කටුනායක පදනම් කරගනිමින් හා 30වන දින වව්නියා නගරය පදනම් කරගනිමින් පවත්වන ලදි. එසේම නොවැම්බර් මස 6, 13, 20 යන දිනයන්හිදී



කටුනායක සහ බියගම කලාප පදනම් කරගනිමින් පවත්වන ලදි. මෙහිදී දිවා ආහාරය සඳහා කෑම පාර්සල් 600කට අධික ප්‍රමාණයක් අඩු ආදායම් ලාභී ඇඟළුම් කම්කරු කාන්තාවන් සඳහා බෙදා දෙන ලදි. තනි මව්වරු පස් දෙනෙකුගේ සහයෝගය මේ සඳහා ලබාගත් අතර ඩාබිඳු කාර්ය මණ්ඩලයේ සහයෝගයද ලබා දෙන ලදි. මේ සඳහා දායකත්වය ලබා දෙන ලද්දේ Asia floor wage සංවිධානය විසිනි.

# ඉලක්කගත කණ්ඩායම් රැස්වීම්

ඩාබිඳු සාමූහිකය විසින් සංවිධානය කරන ලද කමිටු රැස්වීම 2022 ඔක්තෝබර් 19 වන දින බියගම තිළිණ හෝටලයේදී පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා ස්ථිර හා මැන්පවර් නියෝජනය කරන කම්කරුවන් 16 දෙනෙකු පැමිණ සිටියහ. එය මෙහෙයවනු ලැබුවේ ඩාබිඳු සාමූහිකයේ විධායක අධ්‍යක්ෂිකා චමිලා තුෂාරි මහත්මිය විසිනි. මෙහිදී ඔවුන් මුහුණ දෙන ගැටළු රාශියක් පිළිබඳව අදහස් දැක්වීය.

- මැන්පවර් සේවකයන්ගේ එක් දිනක ගෙවීම ඉතා අඩු බව.
- ලැබෙන වැටුප ජීවත් වීම සඳහා ප්‍රමාණවත් නොවන බව.
- ටාගට් වැඩි කිරීම.
- සැපයුම්කරුවන් විසින් ඇණවුම් අවලංගු කිරීම.
- කර්මාන්තශාලා වැසීම.
- සනීපාරක්ෂක පහසුකම් සීමා කිරීම සහ එය භාවිතා කිරීමට අවසර පත්‍ර නිකුත් කිරීම.
- සෞඛ්‍ය සේවා සැපයීමට කර්මාන්තශාලාවල හෙදියන් නොමැති වීම.
- සමස්ථයක් ලෙස මේ වනවිට කර්මාන්තශාලා නිවාඩු ලබා දෙමින් සිටින බවත් ලැබෙන වැටුප ජීවත් වීමට කිසිසේත් ප්‍රමාණවත් නොවන බවත්ය.



# විදෙස් විත්ති

**ඉන්දියාවේ** අගනුවර වන දිල්ලියේ පිහිටි පාවහන් නිෂ්පාදන සහ ඇසුරුම් කම්හලක නොවැම්බර් 1 වැනිදා ඇති වූ ගින්නෙන් කම්කරුවන් දෙදෙනෙක් මිය ගිය අතර තවත් දහඅට දෙනෙක් බරපතල තුවාල ලැබූහ.

මාධ්‍ය වාර්තා වලට අනුව, පාවහන් වල යටිපතුල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන පොලියුරේතීන් යන්ත්‍රයක පිපිරීමක් හේතුවෙන් ගින්න හටගෙන ඇත. ගින්න හටගන්නා විට කම්හලේ කම්කරුවන් 300ක් පමණ සේවය කරමින් සිටි අතර බොහෝ දෙනෙක් ජීවිත බේරා ගැනීම සඳහා ගොඩනැගිල්ලෙන් පිටතට පැන ඇත.

පිපිරීමට පෙර, දෝෂ සහිත යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කරන ලෙස කම්කරුවන් ඉල්ලා සිටි නමුත් කර්මාන්තශාලා හිමිකරු කිසිදු පියවරක් ගෙන නොමැත. මීට අමතරව ගිනි නිවීමේ දෙපාර්තමේන්තුවේ අදාළ සහතික නොමැතිව කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක වී ඇති අතර ගිනි නිවීමේ උපකරණ කිසිවක් නොතිබුණි.

ඉන් දින හතරකට පසුව, ඉන්දියාවේ අගනුවර කාර්මික ප්‍රදේශයේම තවත් පාවහන් කම්හලක තවත් ගින්නක් හටගත්තේය. එහිදී ජීවිත හානි කිසිවක් වාර්තා වී නොමැත.

මෙම කර්මාන්තශාලාවල සේවය කරන බොහෝ කම්කරුවන් පැමිණෙන්නේ රටේ දුෂ්කර ගම්බද ප්‍රදේශවලින් වන අතර කම්කරුවන් මාධ්‍ය වෙත ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් මසකට රුපියල් 12,000 (US$147) උපයන බවත්, දිනකට පැය දහයක් පමණ වැඩ කරන බවත්ය. තුවාල ලැබූ සේවකයන් වෛද්‍ය ප්‍රතිකාර ලබමින් සිටින අතර මියගොස් ඇත්තේ 24 හැවිරිදි සෝනු තාකූර් සහ 20 හැවිරිදි අඛිල් කුමාර යන අයයි. කම්හලේ හිමිකරුට සහ කොන්ත්‍රාත්කරුට එරෙහිව මේ වන විට පොලිසිය නඩු පවරා ඇති බවත් වාර්ථා වේ.

උපුටා ගැනීම අන්තර්ජාලය ඇසුරිනි.

3 පිටුවෙන්... **කාන්තා ප්‍රචණ්ඩත්වයට**

**කෙසේ වෙතත් ඔබ දන්නෙහි ද,**

- ලොව පුරා කාන්තාවන් තිදෙනෙකුගෙන් එක් අයෙකු ශාරීරික හෝ ලිංගික හිංසනය අත්විඳියි - බොහෝ දුරට සමීප සහකරුවෙකු විසිනි.
- ගෝලීය වශයෙන්, කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගෙන් 35%ක් යම් ආකාරයක ශාරීරික සහ/හෝ ලිංගික හිංසනයකට මුහුණ දෙනු ඇත. සමහර රටවල සංඛ්‍යාලේඛන 70%කට ආසන්නයි.
- ලොව පුරා මිනිස් ජාවාරමට ගොදුරු වූවන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් කාන්තාවන් ය.
- ලෝකයේ මිලියන 650ක කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට වයස අවුරුදු 18ට පෙර විවාහ වීමට බල කෙරෙයි.
- රටවල් 30ක කාන්තාවන් සහ ගැහැණු ළමුන් මිලියන 200 ක් කාන්තා ලිංගික ඡේදනයට ලක්ව ඇත.
- අවුරුදු 15ත් 19ත් අතර ගැහැණු ළමයින් මිලියන 15ක් පමණ ඔවුන්ගේ ජීවිතයේ එක් අවස්ථාවකදී බලහත්කාරයෙන් ලිංගිකව හැසිරීමට මුහුණ දෙති.

මෙහදී කාන්තාවන් සහ ගැහැණු ළමුන් ඔවුනට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට උපකාර නොපැතීම ඛේදජනක කරුණකි. ඔබට සිදුවන සෑම හිංසනයක් සඳහාම ඊට එරෙහිව නිසි පියවර ගැනීම සිදුකළ යුතුය. වැඩ ලෝකය තුළ සිදුවන්නාවූ මානසික, ශාරීරික, ලිංගික හා ආර්ථික හිරිහැර හා ප්‍රචණ්ඩත්වය දුරලීම සඳහා අං190 ජාත්‍යන්තර සම්මුතිය සහ නිර්දේශය 2019දී ලෝක කම්කරු සංවිධානය මගින් පිළිගන්නට විය. මෙම සම්මුතීන් ශ්‍රී ලංකාව විසින් සම්මත කරගැනීමට ශ්‍රී ලංකා රජය උත්සුක විය යුතුය. මන්ද යත් වර්ථමානයේදී කාන්තාව වැඩිවශයෙන් හිංසනයන්ට හා ප්‍රචණ්ඩත්වයට ලක් වන්නේ වැඩබිම තුළදී වීම නිසාය. විශේෂයෙන්ම කළාප තුළ සේවය කරනු ලබන කාන්තාව වැඩපලේ දී, මහා මාර්ගයේ දී මෙන්ම නවාතැන තුළදී ද හිංසනයන්ට හා ප්‍රචණ්ඩත්වයට ලක් වේ. එම නිසාම මෙම සම්මුතිය අපරානුමත කිරීම වැදගත් වේ. කෙසේ වෙතත් ඔබට සිදුවන්නාවූ සියලුම හිංසනයන්ට හා ප්‍රචණ්ඩත්වයන්ට එරෙහිව නැගී සිටීම ඔබ සතු අයිතිවාසිකමකි.

මධුමාලි සිරිවර්ධන

(තොරතුරු අන්තර්ජාලය ඇසුරිනි)

# සිතුවිල්ල

"ආ සෝමා මොකද ඇදට වෙලා සයිකො පාරක් දාගෙන ඉන්නේ, කොල්ලා බූට් පාරක් දුන්නද?"

"නැහැ අනේ මේ දවස්වල O.T නැහැ. වැඩපල වහන්න යනවා කියලා ආරංචියි. එහෙම වුනොත් අපට මොකද වෙන්නේ. පසුගිය දවස්වල අමතර දීමනා ලැබුනෙත් නැහැ. මගේ ලඟ තිබුන රත්තරං බඩු ටික උගස් තියලා ගෙදරට සල්ලි යැව්වේ. ගෙවන්න ගත්ත බඩුවලට මුදල් බැන්දෙත් නෑ. ඉතිරිකරගත්ත කෙන්ගෙඩියකුත් නෑ. හරිම අමාරුවෙන් තමයි මේ දවස් ටිකේ ජීවත් වුනේ. අතේ පිච්චියක් නෑ. අර්ථ සාධකය තමයි අපේ ගැලවුම්කාරයා. ඒකටත් විදින්න හැදුවේ. උඹට මතක ඇතිනේ."

"මොකද අමතක, ගැන්සිය පිටින්නේ අපේ කට්ටිය බැස්සේ. මාත් සුසන්තිකා වගේ දුවලා බේරුනේ. නැතිනම් මගේ අඩුත් කැඩිලා බලන විට කලාපය තුළත් විවිධ අරගල තිබිලා තියෙනවානෙ 1980 ගණන්වල සිට. ඇයි අතුරුදහන් කිරීම්. ඒ කාලේ කම්කරුවන්ට සැලකුවේ ඔහොම තමා. දැන් කම්කරුවන් දැනුවත්. ඉස්සර වගේ තලා පෙලා වැඩකර ගන්න බෑ. හතර හන්දි කඩාගෙන ඩොලර් හොයා දෙන අප ගැන කිසිම ගරුත්වයක් නැහැ. කළාපය තුල ජීවත්වන අපි එක සන්තැසිය තමයි විඳවන්නේ. ඒක නෙවෙයි සෝමා වැඩ ඇරී යන විට මා දැක්ක රද්දොළුගම හන්දියේ දෙමාපියන් වගයක් තම පුතාලගෙ ෆොටෝ අතේ තියාගෙන අඬනවා."

"ඇයි ඔයා දන්නෙ නැද්ද? අද ඔක්තෝම්බර් 27 අතුරුදහන් වූ අයගේ අනුස්මරණ දිනයනේ. අම්මලා තාත්තලා අවුරුදු 23ක් තිස්සේ අතුරුදහන් කල තම පුතුන් සිහිකරමින් රජයට බලපෑම් කරනවනෙ එයාලා හොයලා දෙන්න කියලා."

"අනේ මන්දා, අපි දෙගොල්ලොම එකම බෝට්ටුවේ. ඒක නෙවෙයි සෝමේ, අපිව සෙල්ලම්බඩු කියලනෙ මේකෙ ඉන්න සමහර අය සිතන්නේ. ඊයෙ හවස මම වැඩ ඇරිලා එන විට කොහෙදෝ සිට පැමිණි පඟරනැට්ටෙක් මගේ පිටිපස්සට වැරෙන් පහරක් ගසාගෙන මරුපස්ස කියාගෙන ගියානෙ. උදේ ඉදන් මැසිමේ ඉදලා පස්ස හිරිවැටිලා ඉන්න බැරිව හිටියේ. මට තරු විසිවුණා. නැත්තම් මන් හොඳයින් දෙකක් කියනවා."

"ඇයි මම උදේ වැඩට හතිදාගෙන දුවගෙන එනවිට කොහෙන්දෝ පැමිණි නොසන්ඩාලයෙක්,

"ආ නංගියේ මොකද ඔය තරම් ගවුම පළලා, නුල් මදි වුනාද ඉතිරි කොටස මහ ගන්න."

මට යකා නැන්ගා. මම කීවා ඕවා කියනවා එලියෙ දාන් ඉන්න ෂිපර් මැන්ලට කියලා. ඔය වගේ දේවල් බහුලව මේ කළාපය තුළ සිදුවෙනවනෙ. මේ මාසයේ ප්‍රචන්ඩත්ව දිනය සැමරුමට අපට නිදහසේ රැකියාවක් කර ජීවත්වන්න මේ ගෙන්දගම් පොළොවේ බැහැ. දින සැමරුම් නම් නහුතෙට තියෙනවා. අපචාරත් චාරයක් නැතිව සිදුවෙනවා. උසනම් සිකුරිටි. මිටි නම් කම්කරු කීවාලු.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 38

| | | | | |
|---|---|---|---|---|
| 1 වා | | 2 | | 3 |
| | ■ | | ■ | |
| 4 | | තා | 5 | ■ |
| | ■ | ■ | 6 | 7 |
| ■ | 8 | ඩ | | |

**හරහට**

1. පාසල
4. උක් වගාවට ප්‍රසිද්ධ ගමකි
6. තර්ක
8. සාමාන්‍ය ලුණුවල අඩංගු ප්‍රධාන ලෝහමය මූල ද්‍රව්‍ය

**පහළට**

1. ප්‍රධානියා
2. සන්සුන්
3. වැපිරීම
5. ලුණු නිපදවන ස්ථානය
7. රතු සහ නිල් වර්ණ එක්වීමෙන් ඇතිවන වර්ණය

**මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.**

**ඩාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**

# නැගිටිමු අපි එකාවගේ

මොර ගානවා යකඩ කටක්
පැක්ටරියේ උඩුමහලෙන්
වැඩට දිව්වේ පාන්දරින්
ගෙදර ආවේ හඳ පානෙන්

තෙත බරියන් කොන්ඩේ මගේ
දුගඳ හමයි නිතර එයින්
වේලෙන්නට නැත "ටයිමින්"
වැඩ කෙරුවා "ඩා" හෙලමින්
රුපියලකට සීමා කළ
මාගේ ඩා බිඳුව මෙන්න
ඒවගෙ මුතු නෙලාගන්නේ
අරාබියේ තෙල් පප්පලා

අක්කෙ නංගියේ තවමත්
බලන් ඉන්නේ ඇයිද ඉතින්
ඩා බිඳු අපෙ සූරාලා
ලේ බිඳු ටික උරා බීලා
උපයාගෙන යාවි
හපටික මෙහි ගොඩ ගහලා
නැගිටිමු අපි එකාවගේ
සත පනහක් වැඩි කරන්න
නැතිනම් උන් විනාශකර
නිජ භූමිය රැකලා දෙන්න

සේවිකාවක්

# කලාපයේ මතක සටහන්

මේ වන විටත් පාසල නිමවී හුදකලා ජීවිතයක්
ගත කල මා
දහසක් සිතුවිලි පොදි බැඳ සිටියෙමි
ජීවිතය නැමැති පහන් කණුව අභියස
මා නතර වූයේ දුගීකමත් සමඟ
රැකියාවක් නොමැතිවයි...
සමීප යොහෙලියෙකු මාර්ගයෙන් මට
බියගම කලාපය තුල රැකියාවක්
සොයා ගැනීමට හැකිවූයේ වාසනාවකට මෙන්ය...
සිතට මෙන්ම ගතටද නොදැනුවත්වම
කලාපය නැමැති සංග්‍රාම භූමියට
පිවිසෙන්නට වූයෙමි...
ප්‍රථම දින නේවාසිකාගාරයට පැමිණිවිට
පාළුව තනිකම මසිතෙ රජයන්නට විය
කල්යත්ම පාළුව, තනිකම, හුදකලාව නොමැති වූයේ
මිතුරු මිතුරියන් සමීප වූ නිසාවෙනි...
ලොව සපිරි සියළු දනන්ගේ සල්පිළි
ශ්‍රමයෙන් නිමවා. සුළු වැටුපක් ලැබුවේ
සිතට සතුටක් මුසු වූ අසතුටක් සමඟිනි...
රටට විනිමය ලැබෙන්නේ
අප සළු පිළි නිපදවූ හෙයිනි...
සැමදා කලාපයේ යුවතියන් රටට මිණිපහණක්
බඳු වනු නොඅනුමානය........
ශ්‍රමය මෙහෙයවා, කරන සේවය සියලු දෙනාගේ
මතකයේ රැඳී තිබිය යුතුමය. එවිට,
කඳුළු අතරින් සිනාසීමට මටත්
මගේ යෙහෙළියන්ටත් පුළුවන...

දිනූෂා රාජරත්න - බියගම

# දුක

නෙත් කෙවෙනි පුරාවට
උණු කඳුළු නැගෙද්දී
හිතේ දිරියෙන් අම්මේ
මැෂිමේ වැඩ කරන්නේ

සියල් සතුනට හිමි
ඒ සොඳුරු සුව නින්ද
මගේ දෙනෙතට
අම්මේ
අහිමිවේදෝ... මන්දා
හිරු නැගෙන්නට පළමු
මහමගේ අපි දුවන
රැකගන්න කිසිවෙකුත්
හිඳිවිද මන්දා අම්මේ...

ධම්මිකා පත්මිණි

# අම්මා

කුසත් දී
කිරිත් දී
ලේත් දී
පණත් දී
මොකුත්
නොඉල්ලා
රහසේ ම
නික්මයන
ආදරයේ හිත්හාරය
අම්මා

දැනුම් සයුර

# අර්බුධයෙන් අර්බුධයට පත් ඇඟලුම් ක්ෂේත්‍රය

උතුරු ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්තශාලා තුල සේවකයන්ට සිදුවන හිංසනයන් සහ ප්‍රචණ්ඩත්වය වර්ථමානය වන විට සීග්‍ර ලෙස ඉහල යැමට පටන් ගෙන ඇත. විශේෂයෙන්ම බලය ලත් නිලධාරීන් විසින් සේවකයන්ව දැඩි ලෙස හිංසනයට පත් කරනු ලබයි. ඩාබිඳු අපට වාර්ථා වූ පරිදි උතුරු ප්‍රදේශයේ එක් කර්මාන්ත ශාලාවක් තුලදී බලයලත් එක් පුද්ගලයෙක් විසින් තමන්ගේ රහස් අවයව කාන්තා සේවිකාවන් වෙත පෙන්වා තිබුනේ ඔවුනට නියමිත ටාගට් ලබා දීමට නොහැකි වූ නිසාය. එසේම එක් සේවිකාවක් ඇයගේ අතට හානී කරගෙන තිබුනේ ඇයට දරාගත නොහැකි පීඩනයක් එල්ල වූ බැවිනි. එසේම විශේෂයෙන් තමන් ගේ ටාගට් වැඩි කර ගැනීම සඳහා මත්ද්‍රවය සඳහා යොමු වීමද උතුරු ප්‍රදේශයේ මෙන්ම දකුනේද සුලභව දක්නට ලැබෙන සිදුවීම් වී ඇත. එසේම වර්ථමාන ආර්ථික තත්වය හමුවේ ඇඟලුම් කර්මාන්තශාලා සේවක සේවිකාවන්ට තමන්ගේ රැකියාව අහිමි වීමේ තර්ජනයන්ට මුහුණ පෑමටද සිදු වී ඇත.

කෙසේ වෙතත් රටට වැඩිවශයෙන් ඩොලර් ගේන මෙම කර්මාන්තයේ නියුතු සේවක සේවිකාවන්ට වර්ථමානායේ මාස ගණන් නිවසට වී සිටිමින් තම මූලික වැටුප පමණක් ලබමින් ජීවත් වීමට සිදු වී ඇත. හිංසනයන්ට ලක් වෙමින් ජීවත් වීමට නිසි වැටුපක් නොලබන මෙම පිරිස පිළිබඳව වගකිව යුත්තන් අවධානය යොමු නොකරන්නේ මන්දැයි යන්න ගැටළුකාරීය.



අංකඃ 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.